# ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනපති පාඨමාලාව

### MEd (Education Management) 2021/2022(SLQF 10)

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨයේ අධ්‍යාපන පරිපාලන හා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන උක්ත පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**පාඨමාලාව පැවැත්වෙන ස්ථානය** : අධ්‍යාපන පරිපාලන හා සංවර්ධන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය, මීපේ හන්දිය, පාදුක්ක.

**පාඨමාලා කාලසීමාව** : අවුරුදු දෙකයි. (සති අන්තයේ සහ අවශ්‍යතාවය පරිදි සතියේ දින සවස 6.00 න් පසු දේශන පැවැත්වේ)

**මාධ්‍යය** : සිංහල හා දෙමළ

**පාඨමාලා ගාස්තුව** : රු. 150,000.00 (වාරික දෙකකින් ගෙවිය හැක) + ලියාපදිංචි ගාස්තුව රු. 5,000.00 + විභාග ගාස්තු

**පවත්වන ආකාරය** : සම්මිශ්‍රිත ක්‍රමය (Blended Learning) - Online/ Face to Face

**2021 නොවැම්බර් මස පාඨමාලාව ආරම්භ කිරීමට නියමිතය.**

**ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් :**

(i) අධ්‍යාපනවේදී උපාධිය හෝ ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් ප්‍රථම උපාධියක් සමග අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

(ii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය (SLEAS)/ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය (SLTES) / විදුහල්පති සේවය (SLPS) / ශ්‍රී ලංකා ගුරු උපදේශන සේවය (SLTES) /ශ්‍රී ලංකා ගුරු සේවය (SLTS) හෝ අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ වෙනත් අධ්‍යාපන ආයතනයක ප්‍රධානී තනතුරක් හෙබවීම.

**බඳවා ගැනීමේ ක්‍රමය :**

- සම්මුඛ පරීක්ෂණයක් මගින් හෝ ප්‍රවේශ විභාගයක් හා සම්මුඛ පරීක්ෂණය මගින් සිදුකරනු ලැබේ. ප්‍රවේශ විභාගය පැය 02 ක අධ්‍යාපනය පිළිබඳ සාමාන්‍ය දැනීම හා පැය 01 ක අභියෝග්‍යතාව පිළිබඳ ලිඛිත ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.
- අදාළ අයදුම්කරුවන් තෝරා ගනු ලබන අධ්‍යයන වර්ෂයේදී ජාතික අධ්‍යාපන ආයතනයේ කිසිදු පූර්ණ කාලීන/ අර්ධ කාලීන පාඨමාලාවක් හෝ කිසියම් ආයතනයක පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරමින් නොසිටිය යුතුය.

**අයදුම්පත් යොමු කළයුතු ආකාරය :**

1. ජාතික අධ්‍යාපන ආයතනයේ නිල වෙබ් අඩවියේ (www.nie.lk/olcmed2app21.aspx) හි ඇති මාර්ගගත පෝරමය (Online Form) පිරවීම මගින්

සහ

2. ජාතික අධ්‍යාපන ආයතනයේ නිල වෙබ් අඩවියේ (www.nie.lk/naddpage.aspx) ඉංග්‍රීසි භාෂාවෙන් ඇති ඉල්ලුම්පත්‍රය ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් නමින්, ලංකා බැංකුවේ ඕනෑම ප්‍රධාන ශාඛාවක ගිණුම් අංක 7041168 ට අයදුම්පත් ගාස්තු රු. 1500/-ක් බැර කළ යුතුය. ලදුපත පිරවීමේ දී අයදුම්කරන්නාගේ නම හා MEd (Education Management) ලෙස සඳහන් කරන්න. එම ලදුපත, අයදුම්පත සමග අමුණා අධ්‍යක්ෂ, අධ්‍යාපන පරිපාලන හා සංවර්ධන, අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය, මීපේ හන්දිය, පාදුක්ක යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් 2021 සැප්තැම්බර් මස 10 වන දිනට පෙර එවිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ MEd (Education Management) 2021/2022 - (සිංහල / දෙමළ) යනුවෙන් සඳහන් කළ යුතුය.

- ඔබගේ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප වුවහොත් අයදුම්පත් ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.
- වැඩිදුර විස්තර සඳහා 0117601436 දුරකථන අංකයට සතියේ දිනවල පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා අමතන්න.

**ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.**